කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව
මාතර දිස්ත්‍රික්කය

---

1 මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මැයි 26 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මැයි 28 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 23 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

(අ) 2010 ජනවාරි 19 දිනැති අංක PED/54 දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ චක්‍රලේඛය අනුව 2011 ජනවාරි 01 දින සිට පළාත් පාලන ආයතන විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළයුතු වුවත් එම ප්‍රමිති අනුගමනය කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඉදිරිපත් කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන සමඟ එකී ගිණුම් පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කර නොතිබුණි.

1.3.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) උසාවි දඩ ණයගැතියන් සඳහා 2012 වර්ෂය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබූ රු.157,710 ක මුදල මුදල් පොත හර කර ණයගැති ගිණුම බැර කළ යුතු වුවද ජර්නල් සටහන් අංක 33 මගින් එකී මුදල ණයගැති ගිණුම හර කර සමුච්චිත අරමුදල බැර කර තිබුණෙන් මෙම මුදල එකී ගිණුම් අතර ද්විගණනය වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාලව 2013 දෙසැම්බර් 06 දින අංක 8854 ලදුපතින් 2013 පළාත් නිශ්චිත සංවර්ධන සැලැස්මට අදාලව ලැබුණ රු.144,709 ක මුදල ණයගැති ගිණුමට බැර කිරීම නිසා 2013 දෙසැම්බර් 31 දිනට විවිධ ණයගැති මුදල සහ සමාලෝචිත වර්ෂයට අදාල මූලධන ආධාර එකී ප්‍රමාණයෙන් අඩුවෙන් ගිණුම් ගතවී තිබුණි.

(ඇ) ගොඩනැගිලි ඉදිකිරීම්, ඉඩම් වැඩිදියුණු කිරිම් හා, ජල ව්‍යාපෘතියක් සඳහා දරන ලද රු.3,114,034 ක ප්‍රාග්ධන වැය නිසා සභාවට අයත් ස්ථාවර වත්කම්වල වර්ධනයක් සිදුව තිබුණද එකී වියදම ස්ථාවර වත්කම් ගිණුම හර කර ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම බැර කර නොතිබුණි.

(ඈ) පළාත් පාලන ආයතනවල යටිතල පහසුකම් වර්ධනය කිරීමේ වැඩ සටහන යටතේ රු.1,463,200 ක් වටිනා රෝද හතරේ ට්‍රැක්ටරය සහ ට්‍රේලරය 2013 ජුනි 06 දින සභාවට ලබාදී තිබුණද එකී වටිනාකම මෝටර් රථ හා කරත්ත ගිණුම හර කර ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම බැර කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී දරන ලද රු.64,900 ක් වූ ප්‍රාග්ධන වියදම් අයභාර වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේදී 2012 වර්ෂය වෙනුවෙන් ලැබී තිබූ රු.810,332 ක් වූ මුද්දර ගාස්තු ආදායම ලැබීම අදාල ගිණුම් අතර ගැලපීම් කර නොතිබුණි.

(උ) සභාව සතු කැබ් රථය සඳහා ලද රු.66,231 ක රක්ෂණ ගාස්තු ලැබීම අළුත්වැඩියා වියදමින් අඩුකර පෙන්වීම නිසා වියදම එම ප්‍රමාණයට අඩුවෙන් ගිණුම්ගත වි තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේදී 2012 වර්ෂය වෙනුවෙන් වීථි පහන් නඩත්තු කිරීම වෙනුවෙන් ලැබී තිබූ රු.44,064 ක ලැබීම ණයගැති ගිණුම බැර නොකොට සැපයුම් හා උපකරණ වැය ශීර්ෂයට බැර කර තිබුණි. මේ හේතුවෙන් එම ප්‍රමාණයෙන් ණයගැති ගිණුම වැඩියෙන්ද වියදම් ගිණුම අඩුවෙන්ද ගිණුම් ගතවී තිබුණි.

1.3.4 නොසැසඳූ පාලන ගිණුම

---------------------------

ගිණුම් විෂයයන් 04 කට අදාල මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු.48,061,933 ක් වූ අතර උපයෝගී ලේඛන/උපලේඛන අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.50,042,301 ක් වූයෙන් වෙනස රු.1,980,368 ක් විය.

1.3.5 අවිනිශ්චිත ගිණුම

-------------------

ඉකුත් වර්ෂවල සිට ඉදිරියට ගෙන එමින් පවතින රු.1,168,845 ක් වූ අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කර නොතිබුණි.

1.3.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

------------------- -----------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.15,325,332 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ අවසානයට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.1,002,220 ක් විය.

1.3.7 විගණනය සඳහා සාක්ෂි නොවීම

රු.41,531,049 ක් වටිනා ගිණුම් විෂයයන් 05 කට අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

1.3.8 නීති, රීති , රෙගුලාසි ආදියට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| රීති 218 | ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයකට වරක් හෝ පරීක්ෂා කිරීමට සභාපතිවරයා විසින් කටයුතු කළයුතු වුවද එසේ කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2002 නොවැම්බර් 28 දිනැති 2002/02 දරන භාණ්ඩාගාර ලේකම්ගේ චක්‍රලේඛය | පරිඝනක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (ඇ) 2005 මාර්තු 31 දිනැති අංක 08/2005 දරන රාජ්‍ය පරිපාලන ලේකම්ගේ චක්‍රලේඛය | දේපල ණය පිළිබඳ සංශෝධනය කිරීමේ චක්‍රලේඛයේ 11.5 වගන්තිය අනුව දේපළ ණය සඳහා බැංකු පොලී අනුපාතය හා නිලධාරියාගෙන් අයකරන සියයට 4.2 ක පොලී අනුපාතය අතර වෙනස රජය විසින් ප්‍රතිපූර්ණය කළ යුතුය. එසේ වුවද 2013 දෙසැම්බර් 31 දිනට ප්‍රතිපූර්ණය නොවූ මුදල රු.384,000 ක් විය. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,416,946 ක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,564,000 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයයන් | ඇස්තමේන්තුගත මුදල | තථ්‍ය මුදල | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා අක්කර බදු | 336 | 365 | 1,014 |
| කුලී | 5,113 | 5,438 | 2,370 |
| බලපත්‍ර ගාස්තු | 1,257 | 1,611 | 84 |
| වෙනත් ආදායම් හා ආධාර | 27,606 | 28,076 | 14,826 |

2.3 ආදායම් රැස්කිරීමේ කාර්යය සාධනය

(අ) වරිපනම්

2013 ජනවාරි 01 දිනට හිඟ වරිපනම් බදු රු.857,373 ක් වූ අතර එම මුදලින් රු.169,330 ක් පමණක් වර්ෂය තුල අයකර ගෙන තිබුණෙන් අයවීමේ ප්‍රතිශතය සියයට 19 ක් තරම් සුළු අගයක් විය.

(ආ) ජල ගාස්තු

සමාලෝචිත වර්ෂයේ ආරම්භක හිඟහිටි මුදල රු.1,269,077 ක් වූ අතර බිල්කළ මුදල රු.1,297,201 ක් විය. සමාලෝචිත වර්ෂය තුල හිඟ මුදලින් රු.680,589 ක් ලැබී තිබූ අතර අයවීමේ ප්‍රගතිය සියයට 53 ක් විය. බිල්කළ මුදලින් රු.691,105 ක් අයවී තිබූ අතර එහි අයවීමේ ප්‍රගතිය සියයට 53 ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

3.2.1 වීථි පහන් නඩත්තු කිරිම

සභාව විසින් සමාලෝචිත වර්ෂයේදී වීථි පහන් උපකරණ මිලට ගැනීම සහ නඩත්තුකරුවන්ගේ වැටුප් හා දීමනා සඳහා රු.947,000 ක මුදලක් වැයකර තිබුණි. මිලටගත් විදුලි උපකරණ නිකුත් කිරීම හා නඩත්තු කටයුතු සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) සමාලෝචිත වර්ෂයේ වීථි පහන් නඩත්තු කටයුතු සඳහා වැය වූ මුදල් විදුලිය බල මණ්ඩලයෙන් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි.

(ආ) විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශ ලේකම්ගේ 2010 අගෝස්තු 17 හා අංක පීඊ/01/01 චක්‍රලේඛයේ 1.4 ඡේදය අනුව සභා බල ප්‍රදේශය තුල වීථි පහන් නඩත්තු කිරීමේ කටයුතු සිදුකර නොතිබූ අතර සභා බල ප්‍රදේශයෙහි වීථි පහන් සවිකිරීමේදී වීථි පහන් වල විදුලි බල පරිභෝජනය අදාල ප්‍රදේශයේ ගෘහස්ථ හා පොදු කාර්ය සිල්ලර පාරිභෝජනයෙන් සියයට 3 ට සීමාවිය යුතු වුවද ඒ පිළිබඳව අවධානය යොමුකර නොතිබුණි.

3.2 නිෂ්ක්‍රිය සම්පත්
-----------------
සභාව විසින් 2012 හා 2013 වර්ෂවල ඊරියතොට බහු කාර්ය ගොඩනැගිලිවල ඉදිකිරීම හා වැල්හේන්ගොඩ ජල ව්‍යාපෘතිය සඳහා රු.1,893,293 ක මුදලක් වැයකර තිබුණි. පහත කරුණු නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඊරියතොට බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රු.977,589 ක මුදලකට ගිවිසුම් අත්සන් කර තිබූ අතර ගෙවීම් වාර්තා අනුව නිමකළ වැඩවල වටිනාකම රු.943,454 ක් විය. මෙම ඉදිකිරීම් කටයුත්ත ප්‍රතිලාභීන් 302 කට ප්‍රයෝජනවත් බව අදාල වැඩ යෝජනාව ඉදිරිපත් කිරීමේදී සඳහන් කර තිබුණද 2014 වර්ෂයේ සැප්තැම්බර් මාසය වන විටද මෙම ගොඩනැගිල්ල මහජන යහපත සඳහා විවෘත කර නොතිබුණි.

(ආ) වැල්හේන්ගොඩ ජල ව්‍යාපෘතියෙහි ඉදිකිරීම් කටයුතු සඳහා රු.1,044,184 ක වියදමක් කර තිබුණ ද අනාවරණය වූ අතර එකී ව්‍යාපෘතිය මගින් 2014 සැප්තැම්බර් මාසය වන විටද ජලය බෙදාදීමේ කටයුතු ආරම්භ කර නොතිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය
----------------------------------
2013 දෙසැම්බර් 31 දිනට සභාවේ සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| තනතුරු වර්ගය | අනුමත | තථ්‍ය | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|
| තෘතියික | 01 | 01 | | |
| ද්විතියික | 22 | 20 | 02 | |
| ප්‍රාථමික | 42 | 40 | 02 | |
| වෙනත් (අනියම්,තාවකාලික, කොන්ත්‍රාත්) | - | 19 | | 19 |
| | 65 | 80 | 04 | 19 |

සමාලෝචිත වර්ෂයේදී පළාත් පාලන කොමසාරිස් වෙතින් කාර්යය මණ්ඩල වැටුප් හා මන්ත්‍රී දීමනා සඳහා රු.11,079,200 ක මුදලක් ප්‍රතිපූර්ණය කර තිබූ අතර වැටුප් හා දීමනා ලෙස රු.18,538,150 ක මුදලක් වැයකර තිබුණෙන් සභා අරමුදලට රු.7,458,950 ක මුදලක් අතිරේක වැය බරක් වී තිබුණි.

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය
--------------------------------------
4.1 අභ්‍යන්තර විගණනය
----------------------
සභාවේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් පවත්වා නොතිබුණි.

4.2 විගණන හා කළමනාකරණ කමිටු
-----------------------------------
සභාව විගණන හා කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි.

4.3 ප්‍රසම්පාදන සැලැස්ම

----------------------

සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා 2006 ජනවාරි 25 දිනැති අංක පී.ප්‍ර.නි./ප්‍ර.වි.නි./18 දරන චක්‍රලේඛයේ 42(ආ) ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

4.4 අයවැය පාලනය

------------------

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර ඇති අයවැය ලේඛනය අනුව ආදායම් හා වියදම් සම්බන්ධ සැලකියයුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි.

5. පද්ධති හා පාලන

------------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) වත්කම් කළමනාකරණය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) අයවැය පාලනය